ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
දිනය 2012 දෙසැම්බර් මස 7 වැනි දින


## 2012 ඔක්තෝබර් මාසයේදී විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය


ගෙවුම් ශේෂයෙහි වෙළෙඳ ගිණුමේ සමුච්චිත හිඟය, ඔක්තෝබර් මාසය තුළ දී, අඛණ්ඩව 2012 වසර තුළ දෙවන වතාවටත් පහත වැටුණි. එය එ.ජ.ඩොලර් මිලියන 7,590 ක් වූ අතර, 2011 වසරේ අදාළ කාලය සමග සැසඳීමේ දී, එය සියයට 1 ක පහත වැටීමකි. වසරේ මුල් කාලයේ දී ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්ට ප්‍රතිචාරයක් වශයෙන් 2012 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වන කාලපරිච්ඡේදය තුළ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී සියයට 4 කින් පහත වැටුණු අතර එය එ.ජ.ඩොලර් මිලියන 15,754 ක් විය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල්වලට අයත් වන දියුණු ආර්ථිකයන්හි ක්‍රියාකාරකම් ද ඇතුළුව ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපනයන සඳහා වන ඉල්ලුම අඩු වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී, 2012 වසරේ පළමු මාස දහය තුළ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 8,164 ක් දක්වා සියයට 6.6 කින් පහත වැටුණි.

පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී, 2012 ඔක්තෝබර් මාසයේ දී සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩයන්ගේ පහත වැටීමක් වාර්තා වී ඇත. අන්තර් භාණ්ඩ ආනයනය පහත වැටීමට රත්‍රං ආනයන (සියයට 48) සහ පොහොර ආනයන (සියයට 11) සැලකිය යුතු ලෙස දායක විය. සමස්ත ආනයන වියදම පහත වැටීම සඳහා බොරතෙල් ආනයන ඉහළ දායකත්වයක් ලබා දී ඇති අතර, මෙම මාසය තුළ දී බොරතෙල් ආනයනය නොකිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. එහෙත් පිරිපහදු ඛනිජ තෙල් ආනයනය

විශාල ප්‍රමාණයකින් ඉහළ යාම, ඛනිජ තෙල් ආනයන මත වූ වියදම පහත වැටීම් සීමාකරවීමට හේතු විය. අනෙකුත් අන්තර් භාණ්ඩ ආනයනයන් සැලකීමේ දී, මෙම වසර තුළ දී මේ දක්වා සිදු කර ඇති ආනයනයන්ගෙන් සියයට 12 කට පමණ දායකත්වයක් ලබාදුන් ඇඟළුම් ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2012 ඔක්තෝබර් මාසයේ දී සියයට 12.6 කින් වර්ධනය විය. තිරිඟු නිෂ්පාදනය කරනු ලබන ප්‍රධාන රටවලට බලපෑ නියඟ තත්ත්වය හේතුවෙන් තිරිඟු මිල ඉහළ ගිය අතර, මේ නිසා තිරිඟු ආනයන වියදම ද ඉහළ ගියේය. මේ අතර, ප්‍රවාහන උපකරණ වියදම පහත වැටීමත් සමග පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2012 ඔක්තෝබර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ද සියයට 1.3 කින් සුළු වශයෙන් පහත වැටුණි. පාරිභෝගික භාණ්ඩ ආනයන සැලකීමේ දී, ආහාර හා පාන ආනයන වියදම මෙන්ම ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ද පහත වැටුණි. පෙර වසරේ අනුරූප කාලය සමග සැසඳීමේ දී සියයට 65.5 කින් පහත වැටුණු රථවාහන ආනයන, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටීම සඳහා වැඩිම දායකත්වයක් ලබාදෙන ලදී.

කෘෂිකාර්මික අපනයන සහ කාර්මික අපනයන පහත වැටීමත් සමග 2012 ඔක්තෝබර් මාසයේ දී අපනයන ආදායම පහත වැටුණි. කෘෂිකාර්මික අපනයන කාණ්ඩයට අයත් වන, මුළු වෙළෙඳ අපනයන ආදායමෙන් සියයට 14 කට පමණ දායකත්වයක් ලබාදුන් තේ අපනයන ආදායම පහත වැටුණු අතර, මැද පෙරදිග රටවල් කිහිපයකම පැවැති භූ-දේශපාලනික අවිනිශ්චිතතාවයන් මේ සඳහා යම්තාක් දුරට හේතු විය. ඔක්තෝබර් මාසයේ දී රබර්, පොල් සහ පොල් නිෂ්පාදිත ආදායම ද පහත වැටුණි. කෙසේවෙතත්, පෙර වසරේ අදාළ කාලය සමග සැසඳීමේ දී, 2012 ඔක්තෝබර් මාසයේ දී ගම්මිරිස් සහ කරාබුනැටි ඇතුළු කුළුබඩු අපනයන ආදායම වර්ධනය වී ඇත. ගෝලීය ඉල්ලුම පහත වැටීම හමුවේ 2012 වසරේ ඔක්තෝබර් මාසයේ දී කාර්මික අපනයන තවදුරටත් පහත වැටුණි. මුළු අපනයන ආදායමෙන් සියයට 38 කට පමණ දායකත්වය ලබාදෙන ඇඟළුම් අපනයන ආදායම, කාර්මික අපනයන ආදායම පහත වැටීම සඳහා වැඩිම දායකත්වයක් ලබා දී ඇත. 2012 ඔක්තෝබර් මාසයේ අපනයන ආදායම පහත වැටීම සඳහා රබර් නිෂ්පාදිත අපනයන ආදායම මෙන්ම දියමන්ති ඇතුළු මැණික් හා ස්වර්ණාභරණ අපනයන ආදායම පහත වැටීම සැලකිය යුතු අයුරින් දායක විය.



ගෙවුම් තුලනයේ සේවා ගිණුම සහ ජංගම සංක්‍රාම තුළින් වූ ලැබීම් සලකා බැලීමේ දී විදේශ සේවා නියුක්තිකයන්ගෙන් අඛණ්ඩව ලැබෙන ප්‍රේෂණ සහ ඉහළ සංචාරක ඉපයීම් හේතුවෙන් ජංගම ගිණුම තවදුරටත් ශක්තිමත් විය. 2012 වසරෙහි ඔක්තෝබර් මාසයේ දී සංචාරක පැමිණීම් සංඛ්‍යාව 80,379 ලෙස වාර්තා වූ අතර, එය පසුගිය වසරෙහි පළමු මාස දහයට සාපේක්ෂව සියයට 16 කින්, 774,151 ක් දක්වා වර්ධනය විය. සංචාරක ඉපයීම් ද එ.ජ.ඩොලර් මිලියන 790.5 ක් දක්වා පසුගිය වසරට සාපේක්ෂව සියයට 22.1 කින් ඉහළ යන ලදී. මේ අතර, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් අඛණ්ඩව යහපත් වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර, 2012 ඔක්තෝබර් මාසයේ දී පසුගිය වසරේ ඔක්තෝබර් මාසය හා සැසඳීමේ දී සියයට 24.2 කින් වර්ධනය විය. 2012 වසරේ පළමු මාස දහය තුළ දී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 4,941 ක් දක්වා සියයට 17.6 කින් වර්ධනය විය. 2012 වසරේ අවසාන කාර්තුවේ දී සංචාරක ඉපයීම් සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ඉහළ වර්ධනයක් ළඟා කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2012 වසරේ පළමු මාස දහය තුළදී, ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම වෙත විදේශ ව්‍යවහාර මුදල් සැලකිය යුතු ප්‍රමාණයක් ලැබිණි. 2012 ඔක්තෝබර් මස අවසානය වන විට කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ලැබුණු ශුද්ධ විදේශ ආයෝජන ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 268 ක් දක්වා ඉහළ ගියේය. 2012 වසරේ පළමු මාස දහය තුළ දී රාජ්‍ය සුරැකුම්පත්හි විදේශීය ආයෝජන කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සඳහා වූ ශුද්ධ ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 846 ක් විය. මේ අතර, 2012 වසරේ පළමු මාස දහය තුළ දී රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 2,614 ක් විය. මීට අමතරව, 2012 වසරේ ජනවාරි - ඔක්තෝබර් කාලපරිච්ඡේදය තුළ දී වාණිජ බැංකුවල දිගුකාලීන ණය ගැනීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 973 ක් විය. ආයෝජන මණ්ඩලය සමග ලියාපදිංචි වූ සමාගම් වෙත ලැබුනු විදේශ ණය ඇතුළත් මුළු විදේශ සෘජු ආයෝජන ලැබීම් ප්‍රමාණය 2012 වසරේ පළමු මාස නවය තුළ දී එ.ජ.ඩොලර් මිලියන 615 ක් ලෙස වාර්තා වී ඇති අතර, වසරෙහි ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී තවදුරටත් විදේශ ආයෝජන ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2012 ඔක්තෝබර් මාසය අවසාන වන විට, දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 6,547 ක් වූ අතර, දළ නිල සංචිත සහ වාණිජ බැංකුවල විදේශීය වත්කම් ඇතුළත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 8,063 ක් විය. විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස වශයෙන් සැලකූ විට, 2012 ඔක්තෝබර් මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.0 කට සමාන වන අතර, මුළු විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.9 කට සමාන විය.

## සංඛ්‍යා සටහන 1. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් - ඔක්තොම්බර් 2012 [අ]

| කාණ්ඩය | 2011 ඔක්. එ.ජ.ඩො. මිලියන | 2012 ඔක්. එ.ජ.ඩො. මිලියන | ඔක්. වර්ධනය (සියයට) | 2011 ජන. සිට ඔක්. එ.ජ.ඩො. මිලියන | 2012 ජන. සිට ඔක්. එ.ජ.ඩො. මිලියන | ජන. සිට ඔක්. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | **889.1** | **770.4** | **-13.4** | **8,739.7** | **8,163.8** | **-6.6** |
| *මෙයින්,* | | | | | | |
| කෘෂිකාර්මික | 219.2 | 187.5 | -14.5 | 2,109.9 | 1,923.9 | -8.8 |
| *මෙයින්,* තේ | 128.3 | 116.0 | -9.6 | 1,232.6 | 1,147.6 | -6.9 |
| කාර්මික | 667.3 | 575.9 | -13.7 | 6,595.7 | 6,094.7 | -7.6 |
| *මෙයින්,* රෙදිපිළි හා ඇඟළුම් | 356.4 | 297.2 | -16.6 | 3,461.3 | 3,269.4 | -5.5 |
| රබර් නිෂ්පාදිත | 82.9 | 62.9 | -24.1 | 728.6 | 707.2 | -2.9 |
| ආහාර, පාන හා දුම්කොළ | 26.0 | 19.1 | -26.5 | 288.9 | 232.3 | -19.6 |
| ඛනිජ ද්‍රව්‍ය | 2.2 | 6.1 | 176.7 | 28.6 | 48.3 | 68.9 |
| ආනයන | **1,757.0** | **1,580.5** | **-10.1** | **16,406.6** | **15,753.8** | **-4.0** |
| *මෙයින්,* | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 310.9 | 227.8 | -26.7 | 2,997.4 | 2,519.5 | -15.9 |
| *මෙයින්,* ආහාර හා පාන වර්ග | 127.2 | 100.1 | -21.3 | 1,297.0 | 1,094.1 | -15.7 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 183.7 | 127.7 | -30.5 | 1,700.4 | 1,425.5 | -16.2 |
| අන්තර් භාණ්ඩ | 1,063.2 | 974.0 | -8.4 | 9,935.9 | 9,526.4 | -4.1 |
| *මෙයින්,* ඛනිජ තෙල් | 395.0 | 375.6 | -4.9 | 3,816.6 | 4,091.1 | 7.2 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 198.9 | 224.0 | 12.7 | 1,925.6 | 1868.6 | -3.0 |
| ආයෝජන භාණ්ඩ | 381.3 | 376.4 | -1.3 | 3,434.2 | 3,681.8 | 7.2 |
| *මෙයින්,* යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 168.0 | 206.9 | 23.1 | 1,688.5 | 1,807.2 | 7.0 |
| ප්‍රවාහන උපකරණ | 108.4 | 59.8 | -44.9 | 845.4 | 878.0 | 3.9 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 104.6 | 109.6 | 4.8 | 897.2 | 992.9 | 10.7 |
| වෙළෙඳ ශේෂය | **-867.9** | **-810.1** | **-6.7** | **-7,666.9** | **-7,590.0** | **-1.0** |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | **420.6** | **522.1** | **24.2** | **4,202.7** | **4940.8** | **17.6** |
| විදේශීය සෘජු ආයෝජන (ආ) | | | | **679.3** | **614.7** | **-9.4** |
| විවිධ ආයෝජන (ශුද්ධ) | **-0.3** | **18.7** | | **-153.6** | **268.4** | |
| වාණිජ බැංකු විසින් ලබා ගත් දිගුකාලීන විදේශ ණය | | | | | **973.0** | |
| සංචාරක ඉපැයීම් | **67.5** | **79.5** | **17.8** | **647.5** | **790.5** | **22.1** |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඇ) | **369.8** | **310.1** | **-16.1** | **3,761.7** | **4,834.9** | **28.5** |
| මෙයින්, | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 48.2 | 143.2 | 197.4 | 914.7 | 2,097.6 | 129.3 |
| දිගු කාලීන ණය | 281.4 | 153.5 | -45.5 | 2,701.2 | 2,613.7 | -3.2 |

(අ) තාවකාලික

(ආ) ආයෝජන මණ්ඩලයේ අනුමත සමාගම් ලද විදේශීය ණය ද ඇතුළුව, විදේශීය සෘජු ආයෝජන ලැබීම්, වසරේ පළමු මාස නවය සඳහා වාර්තා කර ඇත.

(ඇ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.